සුරාබදු කොමසාරිස් ජනරාල්
ஆணையாளர் நாயகம்
Commissioner General of Excise
011 2 045 000

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්
(ආදායම් ප්‍රතිපත්ති හා පාලන)
மேலதிக ஆணையாளர் நாயகம்
(வருமானக் கொள்கை, நிர்வாகம்))
Additional Commissioner General (Revenue Policy & Admin)
011 2 877 891

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්
(ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම)
மேலதிக ஆணையாளர் நாயகம்
(வருமான முகமைத்துவம், சட்டவலுப்படுத்தல்)
Additional Commissioner General (Revenue Management & Law Enforcement)
011 2 877 892

ෆැක්ස් / பெக்ஸ் / Fax: 011 2 877 890

ඊ-මේල් / மின்னஞ்சல் / E-Mail: excisen@sltnet / ecg@excise.gov

තැ.පෙ. අංකය / த.பெ.இல. / P.O.Box No: 1417

# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
# இலங்கை மதுவரித் திணைக்களம்
# EXCISE DEPARTMENT OF SRI LANKA

අංක 353, කෝට්ටේ පාර. රාජගිරිය. இல.353,கோட்டை வீதி,இராஜகிரிய.. No 353, Kotte Road, Rajagiriya.

මගේ අංකය. / எனது இல: / My No.: එල්.බී./2022/බලපත්‍ර

ඔබේ අංකය. / உமது இல: / Your No.:

දිනය / திகதி / Date: 2021.10.15

**සියළුම සහකාර සුරාබදු කොමසාරිස් වරුන් වෙත,**

**<u>2022 වර්ෂයට සුරාබදු බලපත්‍ර නිකුත් කිරීමට උපදෙස්</u>**

2022 වසරට සුරාබදු බලපත්‍ර නිකුත් කිරීමේදී පහත සඳහන් උපදෙස් වලට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහකාර සුරාබදු කොමසාරිස්ගේ නිර්දේශය සමඟ හැකි ඉක්මනින් ප්‍රධාන කාර්යාලයට එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

1. අභියාචනාධිකරණ නඩු අංක CA/writ/445/2020 දරණ 2021.05.23 දිනැති නඩු තීන්දුව අනුව සුරාබදු බලපත්‍රයක් නිකුත් කිරීමට අදාළ වන මාර්ගෝපදේශ හා කොන්දේසිවලට අනුකූලව අවශ්‍ය වන වාර්තා කැඳවීම සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් පමණක් සිදු කළ යුතුවේ.

2. ඇටෝර්නි බලපත්‍ර මත සුරාබදු බලපත්‍ර ඉල්ලුම් කරන අයදුම්පත්‍ර ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීමේදී ලියාපදිංචි කල ඇටෝර්නි බලපත්‍ර මා වෙත ඉදිරිපත් කළ යුතුය.

3. බලපත්‍ර සම්බන්ධයෙන් මායිම් පිළිබඳ විස්තර නියමිත පරිදි සඳහන් කරන ලෙසත් ර.බී.07 හා 08 බලපත්‍ර ස්ථාන වලට අයත් මායිම් වෙන වෙනම සඳහන් කර ඉල්ලුම්පත්‍ර මා වෙත ඉදිරිපත් කළ යුතුය.

4. බලපත්‍ර අයදුම් කිරීමේ ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කර මා වෙත ඉදිරිපත් කරන විට තක්සේරු වර්ෂ 2021 / 2022 ට අදාල කාර්තු ගෙවීම් සනාථ කිරීමට අදාල ගෙවීම් පත්වල (ආදායම් බදු හා අදාලවේ නම් VAT බදු ගෙවීම් පත්) සහ 2022 වර්ෂයට බලපත්‍ර නිකුත් කිරීමට විරෝධතාවයක් නොමැති බවට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන සහතිකය අමුණා එවිය යුතුය.

5. බලපත්‍ර ස්ථානය ක්‍රියාත්මක වන්නේ බදු පදනම මත නම් බදු ඔප්පුව ලියාපදිංචි කර තිබිය යුතු අතර බදු කාලය අවසන් වන දිනය සහ බලපත්‍ර ස්ථානයේ ලිපිනය අනිවාර්යෙන්ම බදු ඔප්පුවේ සඳහන් කර තිබිය යුතුය.

6. සුරාබදු නිවේදන 902 ට අනුව අංක : 1544/17 – 2008.04.10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 13 (ඊ) කොන්දේසි ප්‍රකාරව, පසුගිය අවුරුදු පහක (අවු.05) කාලය තුලදී බලපත්‍රධාරී දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ සුරාබදු ආඥාපනත යටතේ හෝ වරදකට වරදකරුවෙකු වී නොමැති බවට දැක්වෙන දිවුරුම් ප්‍රකාශය ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

7. බලපත්‍ර ස්ථාන වලට වෙනත් සුරාබදු ඒකක වලින් කාර්මික අපරාධ වාර්තා ඉදිරිපත් වී තිබිය හැකි බැවින් අදාළ ප්‍රදේශයේ සහකාර සුරබදු කොමසාරිස් වෙත සමථ මුදල් අයකර ගැනීමට දැන්විය යුතුය.

8. ර.බී.04 හා ර.බී.22 A බලපත්‍ර ස්ථාන වල එක් දොරක් පමණක් ඇති බවට ඔබ විසින් තහවුරු කර ඒ පිළිබඳ සෑහීමකට පත් විය යුතුය.

9. ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන ලේඛණ වල මුල් පිටපත් නොමැති අවස්ථා වල ඡායා පිටපත් ඉදිරිපත් කරන්නේ නම් සියළු ලේඛණ නීතීඥවරයෙකු හෝ සාමදාන විනිශ්වයකරුවෙකු මගින් සහතික කර තිබිය යුතුය.

10. 2021 වර්ෂයට ලබා ගත් සුරාබදු බලපත්‍රයේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

11. 2022 වර්ෂය සඳහා ඉල්ලුම්පත්‍ර නිකුත් කර ඉතිරි වන ඉල්ලුම්පත් 2022.01.15 දිනට පෙර මා වෙත ඉදිරිපත් කළ යුතුය.

12. 2022 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍ර සමඟ 2021 වර්ෂය තුල සමථ නොවූ කාර්මික අපරාධ වාර්තා නොමැති බවට නිෂ්කාශන සහතිකයද අමුණා එවිය යුතුය. සමථ නොවූ කාර්මික අපරාධ වාර්තා ඇත්නම් වරදට සමාන ඇප තැන්පතුවක් ලබා ගෙන එකී රිසිට් පත්‍රයේ පිටපතක් අයදුම්පත්‍රය සමඟ එවිය යුතුය.

13. 2022 වර්ෂයේ සිට සුරාබදු බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා කාර්මික අපරාධ වාර්තා නිශ්කාෂණ සහතිකය ප්‍රාදේශීය ලෙක්ම්වරුන්ට යොමු කිරීමට අවශ්‍ය නැත.

14. 2022 වර්ෂයට බලපත්‍ර නිකුත් කිරීමට අදාළ නියෝග ලිපි සියල්ල ඔබ වෙත ඉදිරිපත් කරන බැවින් ඔබ හෝ සුරාබදු අධිකාරිගේ සෘජු අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහ බලපත්‍රධාරීන්ට නොපමාව ලබා දීමට කටයුතු කළ යුතුය.

මේ සම්බන්ධයෙන් යම් ගැටළුවක් වේ නම් නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (ආදායම් හා බලපත්) වෙතින් විමසීමට කටයුතු කරන්න.

එම්.ජේ. ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්

එම්. ජේ. ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක 353, කෝට්ටේ පාර, රාජගිරිය

පිටපත් :
1. සියළුම සුරාබදු අධිකාරීවරුන්
2. සියළුම සුරාබදු ස්ථානාධිපතිවරුන්